(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **55.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ජනවාරි 17 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'මැතිවරණ වියදම් නියාමනය කිරීමේ' නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පතෙහි සෙසු විධිවිධාන විභාග කිරීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් සංශෝධන වලට යටත්ව, පනත් කෙටුම්පතෙහි විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවත් පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකි බවටත් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 'නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හතරක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

III

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මහතා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 ජනවාරි 13 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVII කොටස;

(ii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXII, XXIII සහ XXIV කොටස්; සහ

(iii) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXIV, XXV, XXVI හා XXVII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XVII, XVIII, XIX හා XX කොටස්, පස්වැනි කාණ්ඩයේ I, II, III හා IV කොටස් සහ හයවැනි කාණ්ඩයේ XVIII, XIX, XX, XXI, XXII, XXIII, XXIV හා XXV කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 09 දිනැති අංක 2309/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 19 දිනැති අංක 2311/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(iii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා

විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 21 දිනැති අංක 2311/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වා එම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2020 සහ 2021 වර්ෂ සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(iii) 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 අධිකාරය වන) රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ රේගු ආනයන තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 08 දිනැති අංක 2309/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා සහ ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2020 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ධීවර අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් —

(i) 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2018 වර්ෂය සඳහා පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය;

(ii) 2019 සහ 2020 වර්ෂ සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශන; සහ

(iii) 2020 සහ 2021 වර්ෂ සඳහා අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තා

ඉදිරිපත් කර එම වාර්තා, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා කම්කරු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, සභා **මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(11) වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින්—

(i) 2019 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020/2021 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග;

(ii) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි; සහ

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

බත්තරමුල්ල, තලංගම දකුණ, රොබට් ගුණවර්ධන මාවත, නොබැඳි මාවත, අංක 181 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.අයි. විමර්ශනී මිහිරාණි ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2022.11.04 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1):** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 නොවැම්බර් 23 දිනැති අංක 2307/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.01.05 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(පූ.භා.11.52 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා 1.13 ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු කිංස් නෙල්සන් මහතා, ගරු සාරතී දුෂ්මන්ත මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා 2.28 ට ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය විය.)

"ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා 4.00 ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2):** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 දෙසැම්බර් 01 දිනැති අංක 2308/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.01.05 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. විදේශ විනිමය පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2022 දෙසැම්බර් 02 දිනැති අංක 2308/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.01.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත (අංක 126):** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

‘‘පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය’’යි අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**9. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත (අංක 160) :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

‘‘පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය’’යි අධිකරණ, බන්ධනාගාර හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**10. කල් තැබීම :** ‘‘මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය’’යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 4.40 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2023 ජනවාරි 18 බදාදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.